# බුද්ධිමය දේපල කාර්යාලයේ කාර්ය භාරය හා වෙළඳ ලකුණු

ජී.ආර්. රණවක
සහකාර අධ්‍යක්ෂ
බුද්ධිමය දේපල කාර්යාලය

කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින් වෙළඳ ලකුණු හා බුද්ධිමය දේපලෙහි ඇති වැදගත්කම පිළිබඳ යම් අවබෝධයක් ලබා තිබීම, විවිධ කර්මාන්ත හා අන්කම් බිහිවන මෙවන් යුගයක කාලීන අවශ්‍යතාවයකි. ඒ සඳහා " බුද්ධිමය දේපලක් " යනු කුමක්ද යන්න පිළිබඳව වටහා ගනිමු.

## බුද්ධිමය දේපල

මිනිසා විසින් තම මනස වෙහෙසවා නිර්මාණය කරන සියළුම දේ බුද්ධිමය දේපල යටතට ගැනේ. එය නිර්මාණයක්, යම් අදහසක් ඉදිරිපත් කිරීමක්, ගීතයක්, සංගීත නිර්මාණයක්, නව නිෂ්පාදනයක් හෝ සොයා ගැනීමක්, සැලැස්මක්, හෝ යම් වෙළඳ ද්‍රව්‍යයක් හඳුනා ගත හැකි ලකුණක් විය හැකිය. වෙනත් නීතීන් යටතේ ආරක්ෂාකර දෙනු ලබන විවිධ දේපල වර්ග වලින් බුද්ධිමය දේපල වෙනස් වන්නේ එය ස්පර්ශ කළ නොහැකි දේපලක් ( intangible property ) වන බැවිනි. මෙම නිර්මාණයන් එම නිර්මාණකරුවාට ආරක්ෂා කරදෙමින් ඒවායේ ඇතිවන ඵලය සාධාරණ ලෙස මහජනතාව අතර බෙදා හැරීම සඳහා බුද්ධිමය දේපල නිතියක් අවශ්‍ය වේ. ඒ අනුව බුද්ධිමය දේපල නීතිය මගින් පොත්, ලිපි, පරිගණක වැඩසටහන්, ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ, නාට්‍ය, සංගීතය, චිත්‍ර මූර්ති, සැලසුම්, වෙළඳ හෝ සේවා ලකුණු නව නිපැයුම් ආදිය ආරක්ෂා කර දෙනු ලැබේ.

## ශ්‍රී ලංකාවේ බලපවත්නා බුද්ධිමය දේපල නීතිය

ඉංග්‍රීසීන්ගේ යටත් විජිතයක් වූ පසු 1888 වසරේ සිට බුද්ධිමය දේපල නීතිය ලෙස ශ්‍රී ලංකාවේ බලපැවැත්වූනේ ඉංග්‍රීසි නිතියයි. 1948 නිදහස ලැබීමෙන් පසුද විවිධ සංශෝධනයන් සිදු කෙරෙමින් 1979 දක්වාම ඉංග්‍රීසි නීතිය බලපැවැත්විණි. 1977 න් පසු විවෘත ආර්ථික ක්‍රමය ඇතිවීමත් සමග ශ්‍රී ලංකාවට අදාල කරගත යුතු නීතියක අවශ්‍යතාවය ඇතිවිය. ඒ අනුව 1979 අංක: 52 දරණ බුද්ධිමය දේපල නීති සංග්‍රහ පනත යටතේ බුද්ධිමය දේපල නීතිය බලපැවැත්විණි. මෙම පනතට සුළු වශයෙන් සංශෝධනයක් ඇති කරමින් 2003 වසර තෙක්ම එම නීතිය ක්‍රියාත්මක වුණි. 2003 අංක: 36 දරණ බුද්ධිමය දේපල පනත 2003 නොවැම්බර් මස 12 වන දින සිට නව පනතක් ලෙස ක්‍රියාත්මක වන අතර, තාක්ෂණයේ සිදුවූ විවිධ වෙනස්වීම් හේතුවෙන් බුද්ධිමය දේපල නීතියේද සිදුකළ යුතුව තිබූ විවිධ වෙනස්කම්ද මෙම නව පනතේ ඇතුළත් වේ. මෙම නීතිය බලපවත්වන්නේ ශ්‍රී ලංකාවේ භූගෝලීය සීමාව තුළ බව පමණක් යන්නද අප දැන සිටිය යුතු වැදගත් කරුණකි.

## බුද්ධිමය දේපල කාර්යාලයේ කාර්ය භාරය

1980 වනතුරු බුද්ධිමය දේපල පිළිබඳ කටයුතු ඉටු කෙරුණේ සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙනි. 1979 ක්‍රියාත්මක වූ පනත මගින් පේටන්ට් හා වෙළඳ ලකුණු දෙපාර්තමේන්තුව යන්නෙන් නව කාර්යාලයක් ස්ථාපිත කළ අතර, එහි ප්‍රධානියා " පේටන්ට් හා වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර් " ලෙස හැඳින්විනි.

1997 ඇති වූ සංශෝධනයෙන් පසු මෙම කාර්යාලය " ජාතික බුද්ධිමය දේපල කාර්යාලය " ලෙස හැඳින්වෙන අතර, වර්තමානයේ මෙම කාර්යාලයේ ප්‍රධානියා " බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් " ලෙස හැඳින්වේ. කාර්මික සැලසුම් පේටන්ට් බලපත්‍ර සහ වෙළඳ හා සේවා ලකුණු ලියාපදිංචි කිරීම හා ඒ පිළිබඳ පරිපාලනමය කටයුතු බුද්ධිමය දේපල කාර්යාලය මගින් ඉටු කෙරේ.

## වෙළඳ හා සේවා ලකුණු ලියාපදිංචි කිරීම

වෙළඳ හා සේවා ලකුණක් යනු , මහජනතාවට එක් ව්‍යවසායයක භාණ්ඩ තවත් ව්‍යවසායකින් වෙන් කර හඳුනා ගැනීමට උපකාරී වන යම් නිශ්චිත දෘශ්‍යමාන ලාංඡනයකි. යම් වෙළඳ ලකුණක් යනු භාණ්ඩයකට යොදන සලකුණක් වන අතර, සේවා ලකුණු යනු යම් සේවාවකට යොදන ලකුණකි. දැනට වෙළඳපොළේ ඇති මෙම කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ලකුණු කීපයක්ම පහත දැක්වේ.
( දැනුවත් කිරීමේ කාර්යය සඳහා පමණක් මෙම දත්ත සටහන් කෙරේ.)

## වෙළඳ ලකුණු

| | | |
|---|---|---|
| උදා:- | ඇන්කනර්, ලක්ස්ප්‍රේ, | ( කිරි පිටි ) |
| | ලිප්ටන්, ජෝන්ස් | ( තේ කොළ) |
| | නැෂනල්, එල්.. | ( විදුලි උපකරණ ) |
| | අම්රෝ | ( ගෘහ භාණ්ඩ ) |

## සේවා ලකුණු

| | | |
|---|---|---|
| උදා:- | මැක්ඩොනල්ඩ්ස් | (ක්ෂණික ආහාර හා භෝජනාගාර සේවා) |
| | රබට් සිල්වා | ( ප්‍රවාහන සේවා ) |

වෙළඳ ලකුණක් ලියාපදිංචිය හෝ භාවිතය මගින් මහජනතාව අතර ප්‍රසිද්ධියට පත්වී ස්ථාවර වූ පසු භාණ්ඩයක් හෝ සේවාවක් වෙන්කර හඳුනා ගැනීමට අමතරව අදාල භාණ්ඩයේ හෝ සේවාවේ ඇති තත්ත්වය පිළිබඳවද යම් තහවුරු කිරීමක් ඇති කර ගනී. තවද එම වෙළඳ ලකුණ අදාල ව්‍යාපාරයේ කීර්ති නාමයට ( good will ) විශේෂයෙන්ම අනුබද්ධ වේ.

**ඒ අනුව යම් නිෂ්පාදකයෙක්, කර්මාන්තකරුවෙක්, ව්‍යවසායකයෙක් හෝ සේවා සපයන්නෙක් අදාල ව්‍යවසාය ආරම්භ කරනවාත් සමගම මහජනයා අතරට යා හැකි හොඳම මාර්ගය හොඳ වෙළඳ ලකුණක් හෝ සේවා ලකුණකි.** ප්‍රථමයෙන්ම ඒ සඳහා සුදුසු ලකුණක් තෝරා ගැනීම කළ යුතුය. වෙළඳ හෝ සේවා ලකුණක්, වචනයක් හෝ යම් සංකේතයක් (logo) හෝ වචනයක් සමග සංයුක්ත වූ සංකේතයක් විය හැකිය. බුද්ධිමය දේපල නීතියට අනුව, වෙළඳ ලකුණක් අකුරු කිපයක සංයුතියක්, අංක, ලේබලයක්, මුද්‍රාවක්, වර්ණ හෝ හැඩතල සංයෝග කිරීමක් ආදියෙන් සමන්විත විය හැකිය. තමා විසින් තෝරා ගන්නා එම ලකුණු බුද්ධිමය දේපල කාර්යාලයේ ලියාපදිංචි කිරීමකින් තොරව භාවිත කළ හැකි වුවද, බුද්ධිමය දේපල නීතියේ නිසි ආරක්ෂාව ලබා ගැනීමට නම් එය මෙම කාර්යාලයේ ලියාපදිංචි කර සහතිකයක් ලබා ගැනීම අනාගතයේදී වඩා වාසිදායක වනු ඇත.

**වෙළඳ හෝ සේවා ලකුණු ලියාපදිංචි කිරීමේ ක්‍රියා මාර්ගය**

යමෙකු තෝරා ගන්නා වෙළඳ හෝ සේවා ලකුණු බුද්ධිමය දේපල කාර්යාලයේ ලියාපදිංචි කිරීමට අයදුම් කිරීමට ප්‍රථම එම ලකුණ වෙනත් අයෙකු විසින් අයදුම්කර ඇද්දැයි මෙම කාර්යාලයේ ලේඛන පරීක්ෂණයකින් පසු තහවුරු කර ගැනීමට පිළිවන. එම ලකුණ එක් ව්‍යවසායක් තවත් ව්‍යවසායකින් වෙන්කර හඳුනා ගැනීමට හැකිවන ආකාරයට විශේෂිත වූ ආකාරයකින් ඉදිරිපත් කළ යුතුය. ඒවා මේ කාර්යාලයේ ලියාපදිංචි හෝ අයදුම්කර ඇති ලකුණුවලට හෝ තුන්වන පාර්ශවයක ප්‍රසිද්ධ හෝ අප්‍රසිද්ධ ලකුණුවලට කිසිසේත්ම සමාන නොවන ආකාරයකින් තිබිය යුතුය. තවද එම ලකුණ තමා ඉදිරිපත් කරන භාණ්ඩ හෝ සේවා විස්තර නොවන පරිද්දෙන්ද, ආගමික හෝ ජාතික හැඟීම් වලට හා සදාචාරයට හානි නොවන පරිද්දෙන්ද, විශේෂිතවූ භූගෝලීය නාම හෝ වාසගම් වන නාමයන් නොවන පරිද්දෙන්ද, යම් රටක හෝ රජයක හෝ සංවිධානයක නිල ලාංඡන, කොඩි, ආදිය නොවන පරිද්දෙන්ද, සුප්‍රසිද්ධ ලකුණුවලට සමාන නොවන පරිද්දෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහත දැක්වෙන යම් සීමාවන් ඉක්මවා යන්නේ නම් මෙම කාර්යාලය විසින් එම ලකුණු ප්‍රතික්ෂේප කරනු ඇත. එසේ ප්‍රතික්ෂේප වුනහොත් නැවත සලකා බැලීම සඳහා අයදුම්කරුට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය.

පහත දැක්වෙන ආකාරයේ භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිපදවන්නන්ට හා සේවා සපයන්නන්ට එම භාණ්ඩ වලට හෝ සේවාවලට අදාලවන ජාත්‍යාන්තර වර්ගීකරණයට අනුව එම අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. ඒ අනුව ජාත්‍යාන්තර වර්ගීකරණයේ පංති 42 ක් දැනට භාවිතා වන අතර, ඒවා අනුපිළිවෙලින්, කෙටියෙන් පහත පරිදි වේ.

**භාණ්ඩ**

01. කර්මාන්ත හා විද්‍යා කටයුතු වලදී භාවිතා කරන රසායනික නිෂ්පාදන හා ඇලවන ද්‍රව්‍ය

02. තීන්ත වර්ග, පාට, ඩයි වර්ග

03. රෙදි සෝදන කටයුතු සඳහා විරංජන ද්‍රව්‍ය, පිරිසිදු කරන ද්‍රව්‍ය, සබන්, පූයර, දත් බෙහෙත්, විලවුන් ආදිය

04. කාර්මික තෙල් හා ග්‍රීස් වර්ග

05. ඖෂධ, සනීපාරක්ෂක ද්‍රව්‍ය, ප්ලාස්ටර්, වෙළුම් ද්‍රව්‍ය, කෘමිනාශක, වල්පැලෑටි නාශක සහ විනාශකාරී සතුන් නැති කරන මිශ්‍රණ

06. ලෝහ වර්ග සහ මිශ්‍ර ලෝහ, ලෝහමය පයිප්ප සහ නළ, සේප්පු සහ මුදල් පෙට්ටි, ඇණ සහ ඉස්කුරුප්පු, වටිනා ලෝහවලට අයත් නොවන අනිකුත් බඩු

07. යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ, මෝටර් විශාල ප්‍රමාණයේ කෘෂිකර්ම උපකරණ

08. හැඳි ගෑරුප්පු ආදී ද්‍රව්‍ය

09. විද්‍යාත්මක, නාවික, මිණුම් සහ විද්‍යුත් උපකරණ සහ ආම්පන්න, ඡායාරූප, සිනමා කලාවට සම්බන්ධ ද්‍රව්‍ය, දෘෂ්ඨි, ගිනි නිවන උපකරණ

10. කෘත්‍රිම අවයව, ඇස් සහ දත් ඇතුළුව, වෛද්‍ය උපකරණ සහ ආම්පන්න

11. ආලෝක කිරීම, තාපක, වාෂ්ප ජනක, උයන, ශීතකරණ, වේලන යන්ත්‍ර සූත්‍ර ආදිය

12. වාහන

13. තුවක්කු, පුපුරණද්‍රව්‍ය, ගිනි කෙළි ද්‍රව්‍ය

14. වටිනා ලෝහ, ස්වර්ණාභරණ, මැණික් ගල්, වේලාව මනින උපකරණ

15. සංගීත භාණ්ඩ

16. කඩදාසි සහ කඩදාසි ද්‍රව්‍ය, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා, ලිපි, කාර්යාල උපකරණ

17. රබර් වලින් නිෂ්පාදිත භාණ්ඩ, හෝස් පයිප්ප

18. හම් සහ හම් අනුකරණ ද්‍රව්‍ය, ගමන් මලු, කුඩ

19. ගොඩනැගිලි ද්‍රව්‍ය, සිමෙන්ති, හුණු

20. ගෘහ භාණ්ඩ, කණ්නාඩි, ප්ලාස්ටික් භාණ්ඩ

21. කුඩා ගෘහ උපකරණ හා භාජන, ලෝහ භාණ්ඩ, පෝසිලේන් හා වීදුරු බඩු

22. කඹ, ලණු දැල්, කූඩාරම් ආදිය

23. නූල් වර්ග

24. ඇඳ රෙදි සහ දොර රෙදි

25. බූට්, සපත්තු සහ සෙරෙප්පු ඇතුළු ඇඳුම් වර්ග හා නිමි ඇඳුම්

26. රේන්ද පටි, ගෙතුම්, ගොත්තම්

27. කාපට්, පාපිසි, පැදුරු

28. ක්‍රීඩා භාණ්ඩ, සැරසිලි

29. මස්, මාළු, කුකුළු මස්, පිසන ලද පළතුරු, එළවළු, ජෙලි, ජෑම්, කිරි, කිරි නිෂ්පාදන, කෑමට ගන්නා තෙල්, අච්චාරු

30. කෝපි, තේ, කොකෝවා, කේක්, රසකැවිලි, විනාකිරි, සෝස් වර්ග, කුළු බඩු, සහල්, පිටි ආදිය

31. කෘෂිකාර්මික, උයන් වතු, අලුත් පළතුරු, එළවළු, ඇට වර්ග, සතුන් සඳහා ආහාර

32. බීර, මිනරල් බීම, අනෙකුත් මත් නොවන බීම, සිරප් වර්ග

33. වයින් වර්ග, ස්ප්‍රීතු වර්ග සහ මත් බීම

34. අමු හෝ නිෂ්පාදිත දුම්කොළ, දුම් බොන්නන්ගේ භාණ්ඩ, ගිනිකූරු

**සේවා**

35. දැන්වීම් ප්‍රචාරය සහ ව්‍යාපාර

36. රක්ෂණ සහ මුදල්

37. ගොඩනැගීම් සහ අලුත් වැඩියාව

38. සංදේශනය ( communication)

39. ප්‍රවාහනය සහ ගබඩා කිරීම

40. සකස් කිරීම ( treatment of material)

41. අධ්‍යාපනය සහ විනෝදය

42. විවිධ ( හොටල් සේවාව, පරිගණක සේවාවන්, වෘත්තීමය සේවාවන්) ඇතුළුව

එක් පංතියක් ඉදිරිපත් කරන අයදුම්පතකින් ආරක්ෂාව ලැබෙන්නේ එම පංතිය තුළ [illegible] භාණ්ඩ වර්ගයන්ට පමණි. යම් වෙළඳ ලකු[illegible] වැඩි ආරක්ෂාවක් ලබා ගැනීම සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් ලියාපදිංචි කළ හැකිය.

**වෙළඳ ලකුණ අයදුම්පතක් පිළියෙල කිරීම**

ඉහත ආකාරයෙන් තමාට අවශ්‍ය ලකුණ නිර්මාණය කරගත් පසු, මෙම කාර්යාලයේ වෙළඳ ලකුණු ශාඛාවෙන් වෙළඳ ලකුණු අයදුම්පතක් ලබාගෙන එය නිසි අයුරින් සම්පූර්ණ කළ යුතුයි. අයදුම්පතක් ලබා ගැනීමට මුදල් ගෙවීමක් අවශ්‍ය නොවේ. කොළඹ නගරයෙන් ඈත පළාතක සිටින අයදුම්කරුවකුට නම ලිපිනය ලියූ මුද්දර යොදන ලද ලියුම් කවරයක් මෙම කාර්යාලයට එවීමෙන් අයදුම්පතක් තැපැල් මගින් ගෙන්වා ගැනීමට හැකිය.

නිසි අයුරින් සම්පූර්ණ කළ අයදුම්පත්‍රයට නම වෙළඳ ලකුණේ පැහැදිලි පිටපත් හයක් අමුණා රු. 460/-ක අයදුම් කිරීමේ ගාස්තුවක්, (මුදල් හෝ චෙක්පතක් සමගින්) මෙම කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය. මෙම ගාස්තුව රජයේ ගාස්තු වෙනස් කෙරෙන අවස්ථාවලදී වෙනස් වෙනු ඇත.

වෙළඳ ලකුණක් ඉදිරිපත් කළ පසු මෙම කාර්යාලය විසින් ඒ සඳහා වෙළඳ ලකුණු අංකයක් නිකුත් කරන අතර, ලකුණ රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු තෙවන පාර්ශවයකින් කිසියම් විරෝධතාවයක් මතු නොවන්නේ නම් පමණක් ලියාපදිංචි ගාස්තුවකට යටත්ව සහතිකය නිකුත් කෙරෙනු ඇත. ඒ සඳහා අවම වශයෙන් වසර එකක් හෝ ඊට වැඩි කාලයක් ගත විය හැකිය. කෙසේ

*39 පිටුවට...*